**ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමග වූ අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ වූ අග්‍රිම ලැබීම් හා පියවීම් ශේෂ හා භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂ අතර රු.7,150,000 ක් වෙනස්කම් පැවැතිණි. | භාණ්ඩාගාරය විසින් රු.7,150,000ක් හරකර එම අවස්ථාවේදීම බැර කිරීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රකාශයේ ඇතුළත් නොවීය. | දෙපාර්තමේන්තු පොත්වල ශේෂ, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂ සමග සසඳා ගිණුම්වල ඇතුලත් කළ යුතුය. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණු ආදායම් නොවන තැන්පතු ලැබීම් හා ගෙවීම් වටිනාකම්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එම ලැබීම් හා ගෙවීම් වටිනාකම් සමග සැසඳීමේදී රු.1,181,666 ක වෙනස්කම් පැවැතිණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරන පළාත් සභා ආදායම් ලැබීම් සහ ගෙවීම් භාණ්ඩාගාර ප්‍රකාශයේ ඇතුළත් වී නොතිබුණි. ඉදිරියේදි නිවැරදිව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | - එම - |

### 1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකතුව රු.23,560,715 ක් වටිනා ගෙවීම් 74 ක ලදුපත්, ප්‍රතිලාභී ලැයිස්තු, ගැනුම් ඇණවුම්, සැපයුම්කරුවන්ගේ විස්තර, වැඩ අවසන් වාර්තා, ඇඟිලි සලකුණු සටහන්, පැමිණීමේ ලේඛන, වාහන පරීක්ෂණ වාර්තා ආදිය ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනුවල නිවැරදිතාව විගණනයේදි තහවුරු කළ නොහැකි විය. | අදාල ලේඛන හා වාර්තා, ලිපිද්‍රව්‍ය හිඟය හේතුවෙන් අමුණා නොතිබුණි. වර්තමානයේ ඒවා අමුණා ලිපිගොනුවල යොමු අංක ද සඳහන් කර ඇත. | ගෙවීම් සිදුකරන අවස්ථාවේදී අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ත් සියයට 61 ත් අතර පරාසයක ඉතිරි වීම් පැවැති අතර පුනරාවර්තන වැය විෂයයන් 10 ක ඉතිරි වීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 09 ත් සියයට 49 ත් අතර පරාසයක පැවැතිණි. එමෙන්ම, වැය විෂයයන් 02 ක රු. 750,000 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී පැවැතිණි. | වසංගත තත්ත්වය නිසා පරිගණක මෘදුකාංග සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළ නොහැකි විය . | ඇස්තමේන්තු නිවැරදිව සැලැසුම් කළ යුතුය. |
| (ආ) | මූලධන වැය විෂයන් 05 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 ක් හෙවත් රු.3,412,787 ක් ඉතිරි වී තිබුණි. | වසංගත තත්ත්වය මත ඉදිකිරීම්, සේවක පැමිණීම්, හා වාහන ධාවනය අඩු වීම නිසා ඉතිරි වීම් ඇති විය. | මූලධන සංවර්ධන වැඩසටහන් ඉටු කිරීමේදී වැඩි අවශ්‍යතාවට ප්‍රමුඛතාව ලබා දී ඉටු කළ යුතුය. |

**2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවයෙන් ඉවත් වූ හා සේවය අත්හිට වූ, නිලධාරීන්ගෙන් ලැබිය යුතු රු.1,147,050 ක් පසුගිය වර්ෂ 11 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟහිටි ශේෂ නොපමාව අයකර ගැනීමට පියවරගත යුතුය. |

## 2.3 බැදීම් සහ බැරකම්වලට එළැඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් වැය විෂයයක පැවැති රු.715,000 ක බැරකම්, මූල්‍ය ප්‍රකාශන සමග වූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | මෙම මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව පවතින අතැති බිල්පත් වේ. ප්‍රතිපාදන නොලැබීම නිසා බැරකම් ලෙස හෙළිදරව් නොකරන ලදී. | බැදීම් සහ බැරකම් නිසි පරිදි හෙළිදරව් කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ඉටු කළ රු.3,156,060 ක කාර්යයන් සඳහා අක්මුදල් නොලැබීම නිසා ගෙවීම් කළ නොහැකිව පැවැති නමුත් ඒවා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වෙනත් දෙපාර්තමේන්තුවල මූලධන වැඩසටහන් වෙනුවෙන් බැදීම් සහ බැරකම් වශයෙන් රු.1,613,000 ක් දක්වා ඇත. ඉතිරි රු.1,543,060 ක් පුනරාවර්තන වියදම් වේ. | බැදීම් සහ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 48 කින් ලද රු. මිලියන 1,182 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 41 ක් හෙවත් සියයට 3.5 ක ප්‍රතිපාදන ඉතිරි වී පැවැතුණි. | ලද ප්‍රතිපාදනවලින් විශාල ප්‍රමාණයක් පුහුණු පාඨමාලා හා වැඩමුළු සඳහා විය. වසංගත තත්ත්වය හේතුවෙන් එම කාර්යයන් ඉටු කළ නොහැකි විය. | මූල්‍ය ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

**2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන බව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉඩම් සංවර්ධන පනතේ 464 පරිච්ඡේදයේ 19(2) වගන්තියට පටහැනිව, 2014 වර්ෂය තුළ නිකුත් කළ ඉඩම් බලපත්‍ර 702 ක් 2022 මාර්තු මාසය වන විටත් අදාළ ප්‍රතිලාභීන්ට භාර නොදී කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි. | ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් ඔවුන් දැනුවත් කර බලපත්‍ර නිකුත් කරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.7 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 137 ට පටහැනිව, නිසි අනුමැතියක් රහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.247,178 ක ගෙවීම් 04 ක් සිදුකර තිබුණි. | වැරදීමකින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. දැන් නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.8 අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) අනුව, ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත නිරවුල් කළයුතු වුවත්, අවස්ථා 20 ක දී ලබාදුන් එකතුව රු.226,250 ක අතුරු අග්‍රිම දින 18 ත් දින 85 ත් අතර පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) වී මිල දී ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ලබාදුන් රු.700,000ක් මේ දක්වාම අයකර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | එම මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.9** **තැන්පතු ශේෂ**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමට 2018 හා 2020 වර්ෂ අතර කාලය තුළ බැරකළ රු.1,006,716 ක තැන්පතු 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි. | තැන්පතු ආපසු ලබා දීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් රු.1,733,451 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකර තැන්පතු ගිණුමේ ශේෂව පවතී. | තැන්පතු ආපසු ලබා දීමට කටයුතු කර ඇත. | තැන්පතු ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**2.10** **බැංකු ගිණුම් මෙහෙයවීම**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2021 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කළ රු.7,262,923ක ගෙවීම් සඳහා නිකුත් කළ චෙක්පත් 11ක් මුදල් රෙගුලාසි 211ට පටහැනිව 2022 ජූනි මාසය දක්වාම අදාළ ආදායකයින්ට භාර නොදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා තිබුණි. | චෙක්පත් භාරදීම සඳහා කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |
| **(ආ)** | ගෙවීම් නිලධාරියා විසින් ආදායකයාට භාරදිය යුතු රු.5,432,967ක් වටිනා චෙක්පත් 59ක් මුදල් රෙගුලාසි 260 හා 389ට පටහැනිව අදාළ විෂය භාර නිලධාරියා වෙත භාර දී තිබුණි. | චෙක්පත් නියමිත අයට භාර දී සහ ආදායමට මාරු කිරීම් ද සිදුකර ඇත. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ ඇණවුම් කළ භාණ්ඩ කිසිවක් 2022 මාර්තු මාසය දක්වාම ලැබී නොතිබුණි. එහෙත්, මුදල් රෙගුලාසි 137ට පටහැනිව එම භාණ්ඩ ලැබීමට පෙර 2021 වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.2,344,614ක් ගෙවීම්කර තිබුණි. | පූනාකරි හා කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් චෙක්පත් 17ක් ලබාදීමට කටයුතු කර ඇති අතර ඉතිරි චෙක්පත් නියමිත අයට භාර දී ඇත. | මුදල් රෙගුලාසි පරිදි භාණ්ඩ ලැබීමට පෙර මුදල් නොගෙවිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු එකතුව රු. 18,632,707ක් වූ චෙක්පත් 74 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් අත රඳවා ගෙන තිබුණු අතර මුදල් රෙගුලාසි 141 හා 386ට පටහැනිව එම චෙක්පත්වල අණකරුවන්ගේ අත්සන් පවා යොදා නොතිබුණි. | කාර්ය බහුලත්වය නිසා චෙක්පත් 06හි අත්සන් තබා නොතිබුණි. වර්තමානයේ සුදුසු කටයුතු සිදුකර ඇත. ඉතිරි චෙක්පත් සඳහා විගණන නිරීක්ෂණයට අදාළව පිළිතුරු සපයා නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිෂ්පාදන සමුපකාර ව්‍යාපෘතිය යටතේ ලබා දුන් රු.13,475,211ක ගොඩනැගිලි හා උපකරණ වර්ෂ 03කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පවතී. | එක් සමුපකාර සමිතියක හැර ලබාදුන් සියලු උපකරණ හොඳින් භාවිතා වන බවට පිළිතුරු දී තිබුණද, එම සියලු උපකරණ අභාවිතව පවතින බව භෞතික පරීක්ෂණවල දී තහවුරු විය. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |
| (ආ) | වටිනාකම රු.21,552,983 ක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බංගලා 02 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වර්තමාන මිල ගණන් වැඩිවීම් හේතුවෙන් බංගලා 02ක වැඩිදියුණු කිරීම් සිදුකළ නොහැකිව පවති. එහෙත්, කඩිනමින් භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් නිෂ්කාර්යව නොතැබීමට පියවරගත යුතුය. |

**3.2** පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ක් නිම කිරීමට ප්‍රමාද වීම නිසා ගිවිසුම් ප්‍රකාර අයකළ යුතු රු.164,166 ක දඩ මුදල් අයකර නොතිබුණි. | වසංගත තත්ත්වය, විදුලිබල සම්බන්ධතාව ලබා ගැනීමට ප්‍රමාද වීම වැනි හේතු නිසා දඩ ගාස්තු අයකර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | පලෙයි ප්‍රදේශයේ වූ පත්තාවලෙයි මාර්ගය පිළිසකර කිරීමට අවශ්‍ය කළුගල් හා පස් මිල දී ගෙන ප්‍රවාහනයට හා මාර්ගය දෙපස තැන්පත් කිරීම වෙනුවෙන් රු.912,822 ක් ගෙවා තිබුණි. පසුව එම ඉදි කිරීම් අත්හැර දැමීම නිසා ඉටුකළ කාර්යයක් නොවූයෙන් වැයකළ මුදල නිෂ්ඵල වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය එම වර්ෂය තුළ ඉටු කළ යුතු විය. වසංගත තත්ත්වය, අමුද්‍රව්‍ය මිල වැඩි වීම හා වර්ෂා තත්ත්වය හේතුවෙන් ඉදි කිරීම් ප්‍රමාද විය. ඊළඟ වර්ෂයට කාලය දීර්ඝ කළ නොහැකි නිසා ඉටුකළ කාර්යයන්ට ගෙවීම් කර තිබුණි. | රාජ්‍ය මුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**4.** මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 537 කින් පුරප්පාඩු 25 ක් හා අතිරික්ත 08 ක් පැවැතිණි. | ඉදිරියේදි මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. | අවශ්‍යතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත්, අතිරික්ත නිලධාරීන් ඵලදායී ලෙස අනුයුක්ත කිරීමටත් පියවරගත යුතුය. |
| (ආ) | 2021 අගෝස්තු 06 දිනැති අංක 01/2021 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2021 සැප්තැම්බර් 13 දිනැති අංක 18/2021 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයෙ නියුතු නිලධාරීන් 181දෙනෙකුට වර්ෂ 05කට වැඩි කාලයක් ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණි. | වර්ෂ 05කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් සඳහා ස්ථාන මාරු වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |